‍ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2412/14 - 2024 නොවැම්බර් මස 26 වැනි අඟහරුවාදා - 2024.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.- බී. 104/44 (VI)

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත**

114 වන වගන්තිය යටතේ වන නියමය

'යෝගාපුර ජයරත්නම් භාර අරමුදලේ' භාරකරුවන්, එනම් -

1. වෛද්‍ය විමලරාජ් ජයරත්නම්;
2. තුරෙයිරාජා ජෝසප් ජේසුතානාන්දර්;
3. ආරුමුගම් සුන්දරමූර්ති;
4. නඩේසපිල්ලෙයි විජේකුමාර්;
5. සෙල්වරත්නම් අරවින්දන්; සහ
6. වෙට්ටිවේල් විජේකුමාර්;

විසින්, (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වන වගන්තිය යටතේ ඔවුන් සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යවරිය වෙත ඉල්ලුම් කර ඇති හෙයින්;

ඉහත කී ආඥාපනත මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය හරිනි අමරසූරිය වන මම, එකී භාරකරුවන් සංස්ථාගත කිරීමට මේ නියමයෙන් බලය පවරන අතර -

(අ) කොළඹ ප්‍රසිද්ධ නොතරිස්, සුරවීර ආරච්චිගේ වෙලාරි අමන්තිකා සුරවීර විසින් සහතික කරන ලද

1A - G 043128 - 06 (2024/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2023 ඔක්තෝබර් මස 28 වැනි දිනැති අංක 2460 දරන භාර ඔප්පුව යටතේ යථා පරිදි පත් කරන ලද ඉහත නම් සඳහන් භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් 'යෝගාපුර ජයරත්නම් භාර අරමුදල' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු යයි ද;

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමය සහ අභිධානය යටතේ, එකී භාරය වෙනුවෙන්, යම් චංචල හෝ නිශ්චල දේපළක් මිලදී ගැනීම, භාර ගැනීම, දැරීම, ණයට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි යයි ද; සහ

(ඇ) එකී භාරයට අදාළව පැන නගින සියලු නඩුවලදී සහ නඩු කටයුතුවලදී ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ස්ථානයක ඕනෑම අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට, උත්තර දීමට සහ උත්තර දෙනු ලැබීමට, විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතිය අනුව හැකියාව සහ බලය ඇත්තේ යයි ද,

විධාන කොට ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම, හෝ අවශ්‍ය යයි මා හට පෙනී යන ආකාරයට කලින් කල සුළු වශයෙන් වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මා විසින් කරනු ලැබිය හැකි ය.

**හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා,
පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය.

2024 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0162

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.